# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2012



**තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**

**408, ගාලුපාර**

**කොළඹ 03.**

# පටුන


අ) හැඳින්වීම, 1

පෙර දැක්ම හා මෙහෙවර 2

පැවරී ඇති විෂයන් හා කාර්යයන් 3

ආ) පහත බාණ්ඩ යටතේ ප්‍රතිපාදනයන්ට එරෙහිව සත්‍ය වියදම

i. පෞද්ගලික වේතන සහ අමාත්‍යාංශයේ වෙනත් පුනරාවර්තන වියදම් 4

ii. ආයතනයෙහි මුළු පුනරාවර්තන වියදම් 5

iii. විසර්ජන ගිණුමට අදාල ප්‍රාග්ධන වැය විෂය යන කාණ්ඩ යටතේ ප්‍රතිපාදනයන්ට එරෙහි සත්‍ය වියදම 6 -8

ඇ) අත්තිකාරම් ගිණුම් හා අදාල නියම කර ඇති සීමාවන්ට එරෙහිව සත්‍ය සීමාවන් 9

ඇ) වාර්ෂික කාර්යය සැලසුම් ඉලක්කයන් හා ලබාගත් ප්‍රතිඵල 10-18

ඉ) කාර්යය සාධනය පිළිබඳ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නිරීක්ෂණ 19-21

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2012

## තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

## හැඳින්වීම

මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති වැදගත් කාර්යභාරයන් 2ක් වෙයි. එනම් තාක්ෂණය හා පර්යේෂණයයි. රටෙහි ආර්ථික වර්ධනය කඩිනම් සඳහා විද්‍යා හා තාක්ෂණ අංශයන්හි දායකත්වය ඉතා වැදගත් වේ. පර්යේෂණ අංශයෙහි මැදිහත් වීම තුලින් කර්මාන්ත හා සේවා අංශයන්හි තත්වය හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම හා ජනතා සුභසිද්ධිය අපේක්ෂා කෙරේ.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ වාර්ෂික වැඩසටහන් පහත ප්‍රමුඛතා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සකස් කර ඇත.

- ප්‍රතිපත්ති සම්පාදනය,
- පර්යේෂණ හා සංවර්ධනය, තාක්ෂණ පැවරුම්, වාණිජකරණය,
- විද්‍යාව ප්‍රචලිත කිරීම,
- මානව සම්පත් සංවර්ධනය සහ
- යහපාලනය

මෙම කාර්ය සාධන වාර්තාවෙහි 2012 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය ඇතුලත් වේ.

තවද මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2004.02.24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේක අංක 01/2004 හි පරිච්ඡේද අංක "3.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව" හි මාර්ගෝපදේශ අනුව ඉදිරිපත් කර ඇත.

# පෙරදැක්ම

2020 වර්ෂයේදී විද්‍යාව හා තාක්ෂණයෙන් කලාපයේ උසස් රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම

# මෙහෙවර

**ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයට අත්‍යාවශ්‍ය වූ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම හා ආර්ථික ක්‍රියාදාමයන් පුළුල් කිරීම සඳහා, විද්‍යා පර්යේෂණ සංවර්ධනය සහ තාක්ෂණ පැවරුම් ඇතුලත්ව, විද්‍යාව හා තාක්ෂණය දියුණු මට්ටමකට ගෙන ඒමට ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම**

# පැවරී ඇති විෂයයන් සහ කාර්යයන්

අතිගරු ජනාධිපතිතුමන් විසින් ව්‍යවස්ථාවේ 44(1) (අ) වගන්තිය යටතේ 2011 දෙසැම්බර් 14 දිනැති සහ අංක 1736/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ විෂයයන් හා කාර්ය පැවරීම් ප්‍රකාර තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වෙත පහත විෂයයන් හා කාර්යයන් පැවරේ.

- මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ඕනෑම ජාතික ප්‍රතිපත්තීන් හා අනුගතවෙමින් තාක්ෂණ, පර්යේෂණ විෂයයන් සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වෙත පැවරී ඇති සියළු විෂයන් හා අදාලව ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සම්පාදනය කිරීම.
- අදාල පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීමේ අරමුණින්, ජාතික සැලසුම් අධිකාරීන් හා එකඟ වූ කාල සීමාවන් තුල සහ අයවැය ගත කාල සම්පත් ඇතුලත හිඳිමින් එම ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් නවීන කළමණාකරණ ශිල්පීය ක්‍රම සහ තාක්ෂණයන් යොදාගනිමින් ව්‍යාපාරයන්හි කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා සියළු පද්ධතීන් සහ ක්‍රියාවලින් සංශෝධනය කිරීම
- අමාත්‍යාංශය යටතේ සිදුකෙරෙන සියළු මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් සිදුකිරීම
- විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ
- ප්‍රමිතීන් ස්ථාපනය සහ පාලනය
- සමාජ-ආර්ථික පර්යේෂණ
- පර්යේෂණ ආයතන සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම මගින් පර්යේෂණ සැලසුම් කිරීම සහ සිදුකිරීම
- මූලික විද්‍යාවෙහි විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සහ මූලික අධ්‍යයනයන් ප්‍රවර්ධනය
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් අධීක්ෂණය කිරීම

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතට පමුණුවා ඇති ආයතන වනුයේ :

1. නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය
2. කාර්මික තාක්ෂණ ආයතනය
3. මූලික අධ්‍යයන ආයතනය
4. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
5. ජාතික පර්යේෂණ සභාව
6. ජාතික විද්‍යා පදනම
7. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම
8. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය
9. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
10. ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ (පෞද්.) ආයතනය
11. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය
12. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

අ) කාණ්ඩය යටතේ ප්‍රතිපාදනයන්ට එරෙහි සත්‍ය වියදම්

(i) අමාත්‍යාංශයේ පෞද්ගලික වේතන සහ අනෙකුත් පුනරාවර්තන වියදම්

## පුනරාවර්තන වියදම් - 2012

**අමාත්‍යාංශය : තාක්ෂණ හා පර්යේෂණ**
**ශීර්ෂ අංකය : 133**
**කාණ්ඩය : පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන**

| විස්තරය | ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.) | මුළු වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|
| | | | |
| **අමාත්‍ය කාර්යාලය** | | | |
| පෞද්ගලික වේතන | 22,250,000 | 18,384,449 | 3,865,551 |
| වෙනත් පුනරාවර්තන | 33,576,000 | 29,059,096 | 4,516,904 |
| | | | |
| **එකතුව** | **55,826,000** | **47,443,545** | **8,382,455** |
| | | | |
| **පරිපාලන සහ ආයතනික සේවාවන්** | | | |
| පෞද්ගලික වේතන | 40,700,000 | 37,067,336 | 3,632,664 |
| වෙනත් පුනරාවර්තන | 66,150,000 | 59,695653 | 6,454,347 |
| | | | |
| **එකතුව** | **106,850,000** | **96,762,989** | **10,087,011** |
| | | | |
| **විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්** | | | |
| පෞද්ගලික වේතන | 229,255,000 | 223,993,434 | 5,261,566 |
| වෙනත් පුනරාවර්තන | 53,970,000 | 49,104,899 | 4,865,101 |
| | | | |
| **එකතුව** | **283,225,000** | **273,098,334** | **10,126,666** |
| | | | |
| **මුළු එකතුව** | **445,901,000** | **417,304,868** | **28,596,132** |

(ආ) කාණ්ඩය යටතේ ප්‍රතිපාදනයන්ට එරෙහි සත්‍ය වියදම

(ii) ආයතනයන්හි මුළු පුනරාවර්තන වියදම්

## පුනරාවර්තන වියදම් - 2012

අමාත්‍යාංශය : තාක්ෂණ හා පර්යේෂණ
ශීර්ෂ අංක : 133
කාණ්ඩය : පෞද්ගලික වේතන හා වෙනත් පුනරාවර්තන

| විස්තරය | ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.) | මුළු වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|
| **රාජ්‍ය ආයතන** | | | |
| නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සි. ක්ලාක් ආයතනය | 77,000,000 | 69,460,000 | 7,540,000 |
| මූලික අධ්‍යයන ආයතනය | 104,000,000 | 104,000,000 | 0 |
| කාර්මික තාක්ෂණ ආයතනය | 173,270,000 | 169,000,000 | 4,270,000 |
| ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 164,000,000 | 144,816,000 | 19,184,000 |
| ජාතික පර්යේෂණ සභාව | 10,300,000 | 9,189,900 | 1,110,100 |
| ජාතික විද්‍යා පදනම | 84,000,000 | 80,582,000 | 3,418,000 |
| ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම | 22,000,000 | 14,162,150 | 7,837,850 |
| ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | 20,600,000 | 16,466,000 | 4,134,000 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 0,000,000 | 0,000,000 | 0,000,000 |
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | 24,000,000 | 20,992,000 | 3,008,000 |
| | | | |
| **එකතුව** | **679,170,000** | **628,668,050** | **50,501,950** |
| | | | |
| **ග්‍රහලෝකාගාරය** | | | |
| පෞද්ගලික වේතන | 5,000,000 | 4,204,786 | 795,214 |
| වෙනත් පුනරාවර්තන | 9,533,000 | 7,587,545 | 1,945455 |
| | | | |
| **එකතුව** | **14,533,000** | **11,792,331** | **2,740,669** |
| **මුළු එකතුව** | **693,703,000** | **640,460,381** | **53,242,619** |
| | | | |

(ආ) කාණ්ඩය යටතේ ප්‍රතිපාදනයන්ට එරෙහි සත්‍ය වියදම

III විසර්ජන ගිණුම් හා අදාලව එක් එක් ප්‍රාග්ධන වියදම්

## ප්‍රාග්ධන වියදම් -2012

අමාත්‍යාංශය : තාක්ෂණ හා පර්යේෂණ
ශීර්ෂ අංකය : 133
කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම්

| විස්තරය | ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.) | මුළු වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|
| | | | |
| **අමාත්‍ය කාර්යාලය** | | | |
| පුනරුත්ථාපන | 8,577,000 | 2,841,494 | 5,735,506 |
| අත්කරගැනීම් | 3,000,000 | 2,967,347 | 32,653 |
| වෙනත් | | | |
| **එකතුව** | **11,577,000** | **5,808,841** | **5,768,159** |
| | | | |
| **පාලන සහ ආයතනික සේවාවන්** | | | |
| පුනරුත්ථාපනය | 7, 466,000 | 1,921,036 | 5,544,964 |
| අත්කරගැනීම් | 10,400,000 | 8,883,865 | 1,516,135 |
| මානව සම්පත් සංවර්ධනය | 800,000 | 587,440 | 212,560 |
| දෑයට කිරුළ | 8, 900,000 | 6,831,532 | 2,068,468 |
| **එකතුව** | **27,566,000** | **18,223,873** | **9,342,127** |
| **මුළු එකතුව** | **39,143,000** | **24,032,714** | **15,110,286** |

## ප්‍රාග්ධන වියදම් - 2012

**අමාත්‍යාංශය : තාක්ෂණ හා පර්යේෂණ**
**ශීර්ෂ අංක : 133**
**කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම්**

| විස්තරය | ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.) | මුළු වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|
| | | | |
| **විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්** | | | |
| **1. විද්‍යාතා වැඩසටහන** | | | |
| පුනරුත්ථාපන | 5,710,000 | 5,062,973 | 647,027 |
| අත්කරගැනීම් | 52,300,000 | 40,246,601 | 12,053,399 |
| දැනුම පැවරීමේ වැඩසටහන් | 22,000,000 | 19,672,855 | 2,327,145 |
| **එකතුව** | **80,010,000** | **64,982,429** | **15,027,571** |
| | | | |
| **2. විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන්** | | | |
| ආයෝජනයන් | 15,200,000 | 5,561,715 | 9,638,285 |
| **එකතුව** | **15,200,000** | **5,561,715** | **9,638,285** |
| | | | |
| **3. බහුකාර්ය ගැමා පෘථක්කාරක ව්‍යාපෘතිය** | | | |
| ආයෝජනයන් | 128,000,000 | 126,187,782 | 1,812,218 |
| **එකතුව** | **128,000,000** | **126,187,782** | **1,812,218** |
| | | | |
| **4. නිනිති තාක්ෂණ ආරම්භය** | | | |
| ආයෝජනයන් | 405,000,000 | 165,603,503 | 239,396,497 |
| **එකතුව** | **405,000,000** | **165,603,503** | **239,396,497** |
| | | | |
| **5. නැගෙනහිර නවෝදය** | | | |
| ආයෝජනයන් | 7,000,000 | 1,454,313 | 5,545,687 |
| **එකතුව** | **7,000,000** | **1,454,313** | **5,545,687** |
| | | | |
| **6. නව නිපැයුම්කරුවන්ගේ අරමුදල** | | | |
| සංවර්ධන සහායය | 4,000,000 | 0 | 4,000,000 |
| **එකතුව** | **4,000,000** | **0** | **4,000,000** |
| | | | |
| **9. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම** | | | |
| අයෝජනයන් | 6,800,000 | 2,196,180 | 4,603,820 |
| **එකතුව** | **6,800,000** | **2,196,180** | **4,603,820** |
| **මුළු එකතුව** | **646,010,000** | **365,985,922** | **280,024,078** |

# ප්‍රාග්ධන වියදම් - 2012

**අමාත්‍යාංශය : තාක්ෂණ හා පර්යේෂණ**
**ශීර්ෂ අංක : 133**
**කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම්**

| විස්තරය | ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.) | මුළු වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|
| | | | |
| **විදේශ ආධාර වැඩසටහන්** | | | |
| කෘෂි ආහාර ව්‍යාපෘතිය | 100,000,000 | 100,000,000 | 0 |
| නැනෝ තාක්ෂණ සංවර්ධනය (ජාතික විද්‍යා පදනම ) | 1,000,000 | 1,000,000 | 0 |
| | | | |
| **එකතුව** | **101,000,000** | **101,000,000** | **0** |
| | | | |
| **රාජ්‍ය ආයතන** | | | |
| නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය | 65,000,000 | 23,727,429 | 41,272,571 |
| මූලික අධ්‍යයන ආයතනය | 65,000,000 | 54,518,000 | 10,482,000 |
| කාර්මික තාක්ෂණ ආයතනය | 234,450,000 | 97,194,666 | 137,255,334 |
| ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 90,000,000 | 30,289,000 | 59,711,000 |
| ජාතික පර්යේෂණ සභාව | 242,800,000 | 220,940,000 | 21,860,000 |
| ජාතික විද්‍යා පදනම | 311,000,000 | 152,382,718 | 158,617,282 |
| ජාතික විද්‍යා පදනම - විදේශාධාර | 4,051,486 | 4,051,485.50 | 0.50 |
| ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම | 7,200,000 | 1,118,950 | 6,081,050 |
| ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය | 2,000,000 | 1,370,000 | 630,000 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 20,000,000 | 0.00 | 20,000,000 |
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | 40,000,000 | 13,562,000 | 26,438,000 |
| | | | |
| **එකතුව** | **1,081,501,486** | **599,154,248.50** | **482,347,238** |
| | | | |
| **ග්‍රහලෝකාගාරය** | | | |
| පුනරුත්ථාපනය | 2,428,000 | 828,376 | 1,599,624 |
| අත්කරගැනීම් | 3,500,000 | 1,989,230 | 1,510,770 |
| මානව සම්පත් සංවර්ධනය | 50,000 | 15,000 | 35,000 |
| 4 D ඩිජිටල් සවිකිරීම | 90,300,000 | 31,721,248 | 58,578,752 |
| **එකතුව** | **96,278,000** | **34,553,854** | **61,724,146** |
| **මුළු එකතුව** | **1,177,779,486** | **633,708,102.50** | **544,071,3840** |

ඇ) අත්තිකාරම් ගිණුම් හා ආදලව පනවා ඇති සීමාවන්ට එරෙහිව සත්‍ය සීමාව

| රජයේ ක්‍රියාකාරකම්හි උපරිම වියදම් සීමාවන් රු. | රජයේ ක්‍රියාකාරකම්හි උපරිම ලැබීම් සීමාවන් රු. | රජයේ ක්‍රියාකාරකම්හි උපරිම හර ශේෂ සීමාවන් රු. |
|---|---|---|
| 25,000,000 | 9,000,000 | 75,000,000 |

**(ඉ) 2012 වාර්ෂිකව කාර්යය සැලසුම් ඉලක්කයන් හා ලබාගත් ප්‍රතිඵල**

| **(i) විදාතා වැඩසටහන** | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **ඉලක්කය** | **ප්‍රතිඵලය** |
| (1) විදාතා සම්පත් මධ්‍යස්ථාන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම | ගොඩනැගිලි 11ක් ඉදිකිරීම | ගලෙන් බිඳුනු වැව විදාතා සම්පත් මධ්‍යස්ථානයෙහි ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත. කහවත්ත, වැලිගෙපොළ, නිවිතිගල, කිරිඇල්ල, ඕපනායක, මාදම්පේ සහ මුසලි යන විදාතා මධ්‍යස්ථාන ගොඩනැගිලි 7 හි ඉදිකිරීම් කටයුතු දැනට සිදුකෙරෙමින් පවතී |
| (2) ඉලක්ක ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණ පැවරුම් වැඩසටහන් හා දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම | එක් විදාතා සම්පත් මධ්‍යස්ථානයක් සඳහා පුහුණු වැඩසටහන් 24ක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 24ක් සිදු කිරීම (වසරකට වැඩසටහන් 6240ක්) | (i) නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සි. ක්ලාක් ආයතනය මගින් වැඩමුළු 9 ක් සිදුකරන ලදී.<br>(ii) ප්‍රතිලාභීන් 6951 දෙනෙකු සඳහා පසු අස්වනු තාක්ෂණය, සහල් ආශ්‍රිත නිෂ්පාදන, කිරි ආශ්‍රිත නිෂ්පාදන, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන, අඩු වියදම් නිවාස ඉදිකිරීම් තාක්ෂණය සහ පෙරනිමි කොන්ක්‍රීට් දොර සහ ජනෙල් උළුවහු නිෂ්පාදනය, ප්‍රායෝගික ඉලෙක්ට්‍රොනික් පුහුණුව, ජංගම දුරකථන අළුත්වැඩියාව, පරිගණක දෘඩාංග පාඨමාලාව, කාබනික පොහොර නිෂ්පාදන, පළතුරු සහ එළවළු විජලනය හා තවත් තාක්ෂණ පැවරුම් පුහුණු වැඩසටහන් 3259 ක් පවත්වනු ලැබිණි.<br>(iii) නිතිනි තාක්ෂණය, අකුණු සැරවලින් ආරක්ෂා වීමේ ක්‍රම, ව්‍යවසායක සංවර්ධන වැඩසටහන්, සෞඛ්‍ය, පෝෂණය පිළිබඳව හා තවත් දැනුවත් කිරීමේ වැඩසටහන් 2024 ක් ප්‍රතිලාභීන් 96891 දෙනෙකු සඳහා පවත්වන ලදී. |
| 3) විදාතා ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන | තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 100 දෙනෙකු සඳහා තාක්ෂණික සහය ලබාදීම | ව්‍යවසායකයින් 7 දෙනෙකු සඳහා අවශ්‍යතා තක්සේරු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. ව්‍යවසායකයින් 29 දෙනෙකු සඳහා අලෙවි උපායමාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. තාක්ෂණ පැවරුම් වැඩසටහන් පහත පරිදි සිදුකරන ලදී. 07 දෙනෙකු සඳහා පළතුරු සකස් කිරීම් පිළිබඳවද, 8 දෙනෙකු සඳහා කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳවද, සෝයා මීටි රසකාරක ගැන්වීම 03 දෙනෙකු සඳහාද සහ හතු පදම්කරගත් නිෂ්පාදන එක් කෙනෙකු සඳහා ද සිදුකරන ලදී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සිදුකෙරෙන යහපත් නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ව්‍යවසායකයින් 102 සඳහා ද තවත් ව්‍යවසායකයින් 191 දෙනෙකු සඳහා ඉලෙක්ට්‍රොනික් සහ රූපවාහිනී අළුත්වැඩියාව පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. |



නව විද්‍යා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක්



විද්‍යා සම්පත් මධ්‍යස්ථානයක පුහුණු වැඩසටහනක්



විද්‍යා සම්පත් මධ්‍යස්ථානයන්හි පුහුණු වැඩසටහන් පැවැත්වෙන අයුරු



විද්‍යා ව්‍යවසායකයන්



යහපත් ඇසුරුම්කරන පිළිවෙළ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්



කාර්මික තාක්ෂණ ආයතනයේ පැවති
පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්



විදාතා නිෂ්පාදන




යාපනයේ පැවති දිවිනැගුම ප්‍රදර්ශණයේ විදාතා කුටිය


| (ii) සංවර්ධන වැඩසටහන් | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **ඉලක්කය** | **ප්‍රතිඵලය** |
| (1) ද්වි පාර්ශ්වික සහයෝගිතාව<br><br>ඒකාබද්ධ සහයෝගිතා පර්යේෂණ වැඩසටහන (ඉංදු ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්) | • ඒකාබද්ධ සහයෝගිතා පර්යේෂණ සඳහා වැඩමුළු සහ යෝජනා තෝරගැනිම හා ක්‍රියාත්මක කිරීම<br>• ද්විපාර්ශ්වික ගිවිසුම් අනුව කටයුතු කිරිම | දෙරටෙහිම විද්‍යාඥයින් විසින් ඉදිරිපත්කරනු ලැබූ යෝජනාවන් ඇගැයීමට ලක්කිරීමෙන් අනතුරුවන ඉන්දියානු රජයේ සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අන්‍යෝන්‍ය එකඟතාවයෙන් පර්යේෂණ ව්‍යාපෘති 9 ක් සහ වැඩමුළු 02ක් සඳහා අනුමැතිය ලබාදෙන ලදි. දෙරටෙහිම කණ්ඩායම් තනි ව්‍යාපෘතියක් හා සම්බන්ධ වී හවුල් පර්යේෂණයන්හි කටයුතු කෙරෙන පළමු අවස්ථාව මෙයයි. |
| (2) විද්‍යා හා තාක්ෂණ ප්‍රචලිත කිරීමේ වැඩසටහන්<br><br>(අ) ප්‍රදර්ශණ සඳහා සහභාගී වීම | දිස්ත්‍රික් ප්‍රදර්ශණ | දිවි නැගුම ජාතික වැඩසටහන යටතේ පවත්වනු ලැබූ කාර්මික ප්‍රදර්ශණ සඳහා සහභාගී විය. (කොළඹ-අනුරාධපුර දිස්ත්‍රික්කය) පාසැල් ප්‍රදර්ශණ (පොළොන්නරුව-රාජකීය මධ්‍ය මහා විද්‍යාලය, “කිතු දෙවි ප්‍රභා”- ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය-ගාල්ල, “දම් දසි” ධම්මිසර ජාතික විද්‍යාලය-නාත්තන්ඩිය, “Exodo 2012” සිරිකුරුස විද්‍යාලය- කළුතර, “හම්බන්තොට නවෝදය” වැලිපටන්විල විද්‍යාලය-හම්බන්තොට) යන දිස්ත්‍රික්කයන්හි පාසැල් ප්‍රදර්ශණ සඳහා සහභාගීවිය. |
| (ආ) පාසැල් සිසුන් අතර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් ඇතිකිරීම | උතුරු පළාතේ සිසුන්ට (එක් කණ්ඩායමකට 250ක් බැගින්) සහ තෝරාගත් දිස්ත්‍රික්කයන්හි ගුරුවරුන්ට අධ්‍යාපන චාරිකා සඳහා පහසුකම් සැපයීම. | පාසැල් 204 ක පාසැල් සිසුන් සහ ගුරුවරු 5823 දෙනෙක් මෙම වැඩසටහන සඳහා සහභාගී විය. ඔවුහු ජාතික කෞතුකාගාරය, ජාතික සත්වෝද්‍යානය, රත්මලාන ගුවන් හමුදා කෞතුකාගාරයට අමතරව ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය නැරඹීමට එක්වූහ. |
| (3) විද්‍යාත්මක පුහුණුව | නිලධාරීන් 30 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු ලබාදීම | විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 26ක් ව්‍යවසායකත්ව සංවර්ධන, දියර සබන් නිෂ්පාදනය, පසු අස්වනු තාක්ෂණය, ෆයිබර් ග්ලාස් නිෂ්පාදනය, ජාත්‍යන්තර වෙළඳාම, ග්‍රැෆික් නිර්මාණකරණය, ඇසුරුම්කරණය සහ අලෙවිකරණය යන ක්ෂේත්‍ර ඔස්සේ පවත්වන ලදී. |

## (III) බහුකාර්ය ගැමා පෘතක්කාරක පහසුකම ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

| ක්‍රියාකාරකම් | ඉලක්ක | ප්‍රතිඵලය |
|---|---|---|
| (i) සිවිල් ඉදිකිරීමේ කටයුතු | බහුකාර්ය ගැමා පෘතක්කාරක, පහසුකම සපයන යන්ත්‍රාගාරයේ සිවිල් ඉදිකිරීමේ කටයුතු 60% කින් සම්පූර්ණ කිරීම | • සිවිල් ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.<br>• සිවිල් ඉදිකිරීමේ කටයුතුවලින් 60% ක් සම්පූර්ණ කර ඇත.<br>• වැඩබිමට පිවිසෙන මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත.<br>• පෘතක්කාර යන්ත්‍ර සූත්‍ර සවිකිරීම නියමිත පරිදි සිදුකරමින් පවතී. |
| (ii) පෘතක්කාරක යන්ත්‍ර සූත්‍ර සැපයීම | පෘතක්කාරක යන්ත්‍ර සූත්‍ර සවිකිරීම | |




*භූගත තටාකය සඳහා සකස් කරනු ලැබූ කොන්ක්‍රීට් අත්තිවාරම සහ තැම්පත් කිරීමේ ක්‍රියාවලිය*




*භූගත උපාංග සවිකිරීම හා අධීක්ෂණය*









*2012 වර්ෂයේ දෙසැම්බර් මාසය වනවිට ගැමා පෘථක්කාරක යන්ත්‍රාගාරයේ ඉදිකිරීමේ ප්‍රගතිය*

| (IV) ජාතික නිනිති තාක්ෂණ ආරම්භය | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **ඉලක්ක** | **ප්‍රතිඵලය** |
| නිනිති උද්‍යානය නිර්මාණය කිරීම (නිනිති විද්‍යා උද්‍යානය- 1 අ අවධිය) | නිනිති විද්‍යා උද්‍යානය - 1 අවිධිය 40 % කින් සම්පූර්ණ කිරීම | • සිවිල් ඉදිකිරීමේ කටයුතු සිදුකරමින් පවතී<br>• මසකට වරක් උද්‍යාන සංවර්ධන කමිටුව විසින් ඉදිකිරීමේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පිළිබඳ සොයා බලනු ලබයි |



*පිටිපන, හෝමාගම නිනිති විද්‍යා උද්‍යානයේ 1(අ) අවධියේ ඉදිකිරීම් කටයුතු*

| (V) නැගෙනහිර නවෝදය | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **ඉලක්ක** | **ප්‍රතිඵලය** |
| 1. ඉලක්ක ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණ පැවරුම් වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br><br>2. විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම | එක් විද්‍යාතා මධ්‍යස්ථානයක් සඳහා තාක්ෂණ පුහුණු වැඩසටහන් 03 ක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පැවැත්වීම<br><br>එක් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම | විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන මගින් තාක්ෂණ පුහුණු වැඩසටහන් 03 ක් හා එක් දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදුකරන ලදී.<br><br>සෛයින්දමරුදු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකර ඇත. |

| (VI) විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන ක්‍රමෝපාය | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම්** | **ඉලක්ක** | **ප්‍රතිඵලය** |
| i. " තාක්ෂණ වෙළඳපොළ" | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල පර්යේෂණ නිෂ්පාදන හා සේවාවන් හඳුන්වාදීමටත් පර්යේෂණ වාණිජකරණය සිදුකිරීම සඳහා කර්මාන්ත හා ආයතන අතර සහ සම්බන්ධතාවය ගොඩනැගීමටත් ප්‍රදර්ශණයක් හා තාක්ෂණ සැසි පැවැත්වීම | 2011 දෙසැම්බර් මස 10 හා 11 දිනවල විවෘත විශ්ව විද්‍යාලයේ යාපනයේ ප්‍රාදේශිය ශාඛාවේදී තාක්ෂණ වෙළඳපල ප්‍රදර්ශණය සහ තාක්ෂණ සැසි පවත්වන ලදී. මෙහි තේමාව වූයේ " පර්යේෂණ හා තාක්ෂණය තුලින් ප්‍රතිසන්ධාන ගතවීම" අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 10ක් මේ සඳහා දායක විය. මීට අමතරව ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් පාසැල් සිසුන්ට හා මහජනතාව සඳහා රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරක් හා ජල රොකට්ටු සංදර්ශණයක් සංවිධානය කරන ලදී. |





යාපනයේ පැවති තාක්ෂණ සැසි සඳහා සහභාගිවූවන්




රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරේ පැවැත්වූ ජල රොකට් සංදර්ශණය



රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුර

## කාර්ය සාධනය පිළිබඳ ගණන් දීමේ නිලධාරී/ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයාගේ නිරීක්ෂණයන්

2012 වසර තුලදී අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්/වැඩසටහන් පහත පරිදි වේ.

1. විදාතා වැඩසටහන
2. ජාතික නිනිති තාක්ෂණ ආරම්භය
3. බහුකාර්ය ගැමා පෘථක්කාරක පහසුකම ස්ථාපනය කිරීම
4. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම
5. නැගෙනහිර නවෝදය
6. විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

### 1. විදාතා වැඩසටහන

මෙම වැඩසටහනෙහි ප්‍රධාන පරමාර්ථයන් වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත තාක්ෂණය පවරා දෙමින් ඔවුන්ගේ ජිවන තත්ත්වයක් ඉහල නංවාලිමට ක්‍රියාමාර්ග ගැනිමයි.

- කහවත්ත, ඕපනායක, මාදම්පේ, කිරිඇල්ල, නිවිතිගල, වැලිගෙපොළ, මුසලි යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හතෙහි විදාතා සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු දැනට සිදුකෙරේ.
- සෑම දිස්ත්‍රික්කයකම සිදුවූ විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු හේතුවෙන් තාක්ෂණ පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් පහල මට්ටමේ කාර්යය සාධනයක් වාර්තා විය.

### 2. ජාතික නිනිති තාක්ෂණ ආරම්භය (NNI)

කර්මාන්ත අංශය සඳහා නිනිති තාක්ෂණය මත පදනම් වූ පර්යේෂණයන් සහ සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම හරහා වැඩි විදේශ විනිමයක් උපයා ගැනිමට ජාතික නිනිති තාක්ෂණ ආරම්භය මගින් අපේක්ෂිතය. 2012 වසර සඳහා ද නිනිති විද්‍යා උද්‍යානයෙහි අදියර (1අ) සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදනයන් වෙන්කරනු ලැබිණි.

- නිනිති විද්‍යා උද්‍යානයෙහි අදියර 1 (අ) හි ඉදිකිරීම් කටයුතු නියමිත කාලයන්ට අනුකූලව ක්‍රියාත්මකව පවතී
- උද්‍යාන සංවර්ධන කමිටුව විසින් මාසිකව ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කෙරේ.

### 3. බහුකාර්ය ගැමා පෘථක්කාරක පහසුකම ස්ථාපනය කිරීම (MGIF)

බහුකාර්ය ගැමා පෘථක්කාරක ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වනුයේ ජිවානුහරණ ක්‍රියාවලිය හරහා වෛද්‍ය නිෂ්පාදන සහ ආහාර නිෂ්පාදනයන්හි ගබඩා කාලය දීර්ඝ කිරීමයි. මෙම අරමුණ සපුරාලිම සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරනු ලබන බලාගාරයක් හරහා දේශිය නිෂ්පාදනයින්ට වඩා හොඳ අපනයන වෙළඳපොළක් ලබාදීමත්, එමගින් ආනයනයන් මත වැයකරනු ලබන විදේශ විනිමය ප්‍රමාණය පහත හෙළීමත් අපේක්ෂා කෙරේ.

මෙම පහසුකමෙහි සිවිල් ඉදිකිරීම් කටයුතු ගැටළුකාරී තත්ත්වයකින් තොරව ක්‍රියාත්මකව පවතී. අවශ්‍ය කෙරෙන ප්‍රමිතීන් හා අනුකූලත්වය දැක්වීම සහතික කරනු පිණිස, ප්‍රතික්කාරක බලාගාරය සහ පහසුකම සඳහා සපයා ඇති අනෙකුත් උපකරණ සවිකිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලාංකික උපදේශකවරුන් කණ්ඩායමක් පත්කොට ඇත.

## 4. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම

විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්‍රමෝපාය තුල හඳුනාගනු ලැබූ ප්‍රධාන සංරචකයක් වන්නේ පර්යේෂණ වාණිජකරණයයි. පර්යේෂණයන් වාණිජකරණය කිරීමේ ආරම්භක පියවරක් ලෙස සහ කර්මාන්ත අංශය හා අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනයන් අතර සම්බන්ධතාවක් ගොඩනංවා ගැනීමේ අරමුණින් 2012 දෙසැම්බර් 10 සහ 11 දෙදින යාපනයේදී ප්‍රදර්ශණයක් සහ තාක්ෂණික සැසි පවත්වන ලදී. මෙයට අමතරව ප්‍රදේශයේ සිසුන්ට සහ මහජනතාවට රාත්‍රි අහස නිරීක්ෂණ කඳවුරු ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් පවත්වනු ලැබිණි.

## 5. නැගෙනහිර නවෝදය

කරවල නිෂ්පාදනය, තල් ආශ්‍රිත නිෂ්පාදන සහ සහල් ආශ්‍රිත සැහැල්ලු ආහාර පිළිබඳ තාක්ෂණ පැවරුම් පුහුණු වැඩසටහන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් පවත්වනු ලැබිණි. කන්තලේ සහ සයින්දමරුදු විද්‍යා සම්පත් මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි ඉදිකරනු ලැබිණි.

## 6. විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

අ) ද්විපාර්ශ්වික සහයෝගිතාවය

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ඉන්දියානු රජයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිතා වැඩසටහනකට 2011 වසරේදී එළැඹිණි. මෙම සහයෝගිතා වැඩසටහන යටතේ, දෙරටටම වැදගත් වන ඒකාබද්ධ සහයෝගිතා පර්යේෂණ වැඩසටහන්හි නියුක්ත වීමට දෙරටෙහි විද්‍යාඥයින්ට අවස්ථාව උදාකර දී ඇත. මෙම සහයෝගිතා වැඩසටහන යටතේ හඳුනාගනු ලැබ ඇති පර්යේෂණ ක්ෂේත්‍රයන් වනුයේ ආහාර විද්‍යාව සහ තාක්ෂණය, සාගර විද්‍යාව/ප්‍රෘථිවි විද්‍යාව, ජෛව තාක්ෂණය/සම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව ඇතුලත්ව ඖෂධ සම්බන්ධ ද්‍රව්‍ය පර්යේෂණ යනාදියයි.

දෙරටෙන්ම ඉදිරිපත් කරනු ලැබූ යෝජනා ඇගයීමට ලක්කරනු ලැබූ අතර, ඉන්දියානු රජයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ අන්‍යෝන්‍ය එකඟත්වයෙන් ව්‍යාපෘතීන් 09 කට සහ වැඩමුළු 2ක් සඳහා අනුමැතිය ලබාදෙන ලදී. එකම ව්‍යාපෘතියක් තුල දෙරට විසින්ම සහයෝගිතා පර්යේෂණයන් සිදුකෙරෙන ප්‍රථම අවස්ථාව මෙයවේ.

ආ) විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීමේ වැඩසටහන

(i) ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලැබූ ප්‍රදර්ශණ

දැයට කිරුළ වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන් විසින් දැනුවත් කිරීමේ වැඩටසටහන් රාශියක් පවත්වන ලදී.

මෙම ප්‍රදර්ශණයේදී මූලික අධ්‍යයන ආයතනය විසින් දිස්ත්‍රික්කයේ ජල සාම්පලයන්හි තත්ත්ව පරීක්ෂාව සිදුකරන ලදී. මෙයට අමතරව විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් විද්‍යාතා මධ්‍යස්ථාන මගින් පවත්වන ලදී. විද්‍යාව හා තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම උදෙසා කලාපීය මට්ටමින් ප්‍රදර්ශණ ගණනාවක් සඳහා අමාත්‍යාංශය සිය සහභාගිත්වය දැක්වීය.

**(ii) විශේෂ පාසැල් වැඩසටහන**

පාසැල් සිසුන් අතර විද්‍යාව ප්‍රචලිත කිරීමේ අරමුණින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබිණි. දුර බැහැර සහ දුෂ්කර ප්‍රදේශයන්හි ශිෂ්‍යයින් ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන සැලසුම් කොට ඇත. උතුරු පළාත සඳහා වූ මෙහි පළමු වැඩසටහන් ගරු තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමන් සහ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් 2012 නොවැම්බර් 07 වන දින ආරම්භ කරනු ලැබූ අතර යාපනය අධ්‍යාපන කලාපයේ සිසුන් 250 කගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. රාජකීය විද්‍යාලයේ බාලදක්ෂයින් විසින් කඳවුරක් පවත්වමින් සිසුන් පිළිගන්නා ලදී. මෙම වැඩසටහන සඳහා උතුරු, මධ්‍යම සහ සබරගමුව පළාතේ පාසැල් 204 ක සිසුන් 5823 දෙනෙක් සහභාගි වූහ. මෙම සිසුහු කාර්මික තාක්ෂණ ආයතනය, නර්ඩ් ආයතනය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය, ජාතික සත්වෝද්‍යානය, සහ ජාතික කෞතුකාගාරය වෙත චාරිකාවන්හි නියැළෙමින් ඒවායේ කාර්යභාරය හා ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුවත් වූහ.

**ඇ) විද්‍යාත්මක පුහුණුව**

සිය මානව සම්පත් හැකියාවන් වැඩිදියුණු කරගැනීම පිණිස අමාත්‍යාංශයේ සහ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයන්හි නිලධාරීන් 515 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් දේශීය පුහුණු ආයතනයන්හිදී පවත්වන ලදී.